# ECONOMIC GROWTH
# &
# DEVELOPMENT
# (Part-I)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of Sri Jayewardenepura***

# ආර්ථික වෘද්ධිය

ආර්ථික වෘද්ධිය යන්නෙන් අදහස් වන්නේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ අඛණ්ඩ වැඩි වීම යි.

න්‍යායාත්මක ප්‍රවේශයක් ඔස්සේ නිර්වචනය කරන විට ආර්ථික වෘද්ධිය යනු ආර්ථිකයේ භාණ්ඩ හා සේවා නිෂ්පාදන ධාරිතාව හෙවත් විභව නිමැවුම ප්‍රසාරණය වීම යි.


ආර්ථික වෘද්ධියක දී ආර්ථිකයේ මූර්ත නිමැවුම දිගු කාලීනව ප්‍රසාරණය වීමක් සිදු වේ.

නමුත් සැබවින් ම ආර්ථික වෘද්ධිය යනුවෙන් අදහස් කරනුයේ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමෙහි ලා ආර්ථිකය සතු ධාරිතාව ප්‍රසාරණය වීමයි.

ClassWork.LK

# ආර්ථික වෘද්ධිය පෙන්නුම් කළ හැකි ආකාර


1. නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් ඇසුරෙන් පෙන්වීම




ඉහත රූප සටහනේ නිෂ්පාදන හැකියා මායිම PPF1 සිට PPF2 දක්වා විතැන් වීම මගින් ආර්ථික වෘද්ධි ක්‍රියාවලිය නිරූපණය කර ඇත.

ClassWork.LK

2. සමාහාර ඉල්ලුම් හා සමාහාර සැපයුම් ඇසුරෙන් පෙන්වීම.




ඉහත රූප සටහනට අනුව ආර්ථිකයේ දිගු කාලීන සමාහාර සැපයුම් වක්‍රය $AS_1$ සිට $AS_2$ දක්වා දකුණට විතැන් වීම මගින් ආර්ථිකයේ විභව නිමැවුම් මට්ටමේ වැඩි වීම නිරූපණය කළ හැකි ය. විභව නිමැවුම් මට්ටම වැඩි වීමෙන් පෙන්නුම් කරනුයේ ආර්ථික වෘද්ධිය යි.

# ආර්ථික වෘද්ධිය මැනීම සඳහා භාවිත කරන ක්‍රම

ආර්ථික වෘද්ධිය මැනීම සඳහා ක්‍රම දෙකක් භාවිත කරයි.

1. කාලයක් සමග මූර්ත දළ දේශීය නිෂ්පාදිතයෙහි හෝ ශුද්ධ දේශීය නිෂ්පාදිතයෙහි හෝ හටගන්නා වැඩි වීම

2. කාලයක් සමග ප්‍රතිශීර්ෂ මූර්ත දළ දේශීය නිෂ්පාදිතයෙහි හෝ ප්‍රතිශීර්ෂ ශුද්ධ මූර්ත දේශීය නිෂ්පාදිතයේ හෝ හටගන්නා වැඩි වීම

# ආර්ථික වෘද්ධි අනුපාතිකය

ආර්ථික වෘද්ධිය මනිනු ලබන්නේ ආර්ථික වෘද්ධි අනුපාතිකය මගිනි.

$$\text{ආර්ථික වෘද්ධි අනුපාතිකය} = \frac{(\text{අදාළ වර්ෂයේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතය} - \text{පෙර වර්ෂයේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතය})}{\text{පෙර වර්ෂයේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතය}} \text{ X } 100$$

ClassWork.LK

**නිදසුන් :**

අදාළ වර්ෂයේ මූර්ත දළ දේශීයනිෂ්පාදිතය රු. ට්‍රිලියන 210 යැයි ද පෙර වර්ෂයේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතය රු. ට්‍රිලියන 200 යැයි ද සිතමු. එවිට,

$$\text{ආර්ථික වෘද්ධි අනුපාතය} = \frac{210 - 200}{200} \times 100$$

$$= \underline{5\%}$$

ClassWork.LK

# ආර්ථික වෘද්ධිය තීරණය කරන සාධක

ආර්ථික වෘද්ධිය තීරණය කරන සාධක පහත පරිදි දැක්විය හැකි ය.

- සම්පත් සම්භාරය
- භෞතික ප්‍රාග්ධනය
- මානව ප්‍රාග්ධනය
- ස්වාභාවික ප්‍රාග්ධනය
- සමාජ ප්‍රාග්ධනය
- ඵලදායිතාව
    - තාක්ෂණය
    - මානව ප්‍රාග්ධනය
- ආර්ථික ස්ථායීතාව
    - දේශපාලන ස්ථාවරත්වය
    - යහපාලනය

ClassWork.LK

## ආර්ථික වෘද්ධියේ වැදගත්කම

ආර්ථික වෘද්ධියේ වැදගත්කම පහත සඳහන් පරිදි වේ.

- ඉහළ ජීවන මට්ටමක් අත්පත් කර ගැනීමට හැකි වීම

- සේවා නියුක්තිය ඉහළ යාම

- සාර්ථක රාජ්‍ය මූල්‍ය කළමනාකරණයක් පවත්වා ගත හැකි වීම

- ආයෝජන ශක්තිමත් වීම

- විශ්වසනීයත්වය වර්ධනය වීම නිසා ව්‍යාපාරිකයන්ගේ ලාභ වැඩි වීම

ClassWork.LK

## ආර්ථික වෘද්ධියේ පිරිවැය

ආර්ථික වෘද්ධියේ පිරිවැය පහත සඳහන් පරිදි දැක්විය හැකි ය.

- පාරිසරික ගැටලු ඇති වීම
- පරිසර දූෂණය
- පරිසර හායනය
- ප්‍රතිෂ්ඨාපනය කළ නොහැකි සම්පත් විනාශ වීම
- නිෂ්පාදනයේ හා පරිභෝජනයේ සෘණ බාහිරතා ඇති වීම
- ආර්ථිකයේ උද්ධමනකාරී තත්ත්වයන් පැන නැගීම
- ආදායම් විෂමතා හට ගැනීම
- ප්‍රාදේශීය විෂමතා හට ගැනීම
- ජනතාවගේ ශුභසාධනය වර්ධනය වන ක්ෂේත්‍ර තුළ ආදායම ආයෝජනය නොවුවහොත් ජීවන තත්ත්වයට බලපෑම් ඇති වීම
- වර්තමාන පරිභෝජනය පහළ යාම

ClassWork.LK

## වෘද්ධි ක්‍රියාවලිය ජය ගත් රටවල පොදු ලක්ෂණ

වෘද්ධි ක්‍රියාවලිය ජය ගත් රටවල පොදු ලක්ෂණ පහත දැක්වේ.

- ගෝලීය ආර්ථිකයෙහි පූර්ණ ලෙස වාසි ලබා ගැනීම
- සාර්ව ආර්ථිකයෙහි ස්ථායිතාව පවත්වා ගැනීම
- ඉහළ ඉතුරුම් හා ආයෝජන මට්ටමක් රඳවා ගැනීම
- සම්පත් බෙදා හැරීම වෙළෙඳපොළ බලවේග මගින් සිදු වීම
- කැපවුණු, විශ්වාසනීය හා කාර්යක්ෂම ආණ්ඩු පැවතීම

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති
## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura